රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 34/2025

මගේ අංකය : EST-1/MISCL/06/0032(II)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2025.12.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## 2026 වසර - රාජකාරි කටයුතු ඇරඹීම

2026 නව වසර ඇරඹුමට පෙර 2025 වසරේ අගභාගයේ ශ්‍රී ලංකාව මුහුණ දුන් "දිට්වා" සුළි කුණාටු තත්ත්වය හේතුවෙන් උද්ගත වූ විස්තීරණ ආපදා හේතුකොටගෙන රටෙහි ඇති වූ ව්‍යසනකාරී තත්ත්වය තුළ දී රජයේ සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමටත් රටේ සාමාන්‍ය ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම සඳහාත් රජයේ නිලධරයන් දැක්වූ කැපවීම් සහගත ක්‍රියාකාරී සේවය ඉතා ප්‍රශංසනීය බව සඳහන් කරමි.

02. එම ව්‍යසනකාරී තත්ත්වය හේතුවෙන් රාජ්‍ය නිලධරයන් ලෙස අප මුහුණ දෙන ප්‍රධාන අභියෝග දෙකකි. එක් පසෙකින් අඩාල වූ ජන ජීවිතය සහ භෞතික සම්පත් නැවත යථාවත් කිරීම සඳහා කටයුතු කළයුතු වන අතරම, අනෙක් පසෙන් එම යථාවත් කිරීම් සඳහා යොදවන මූල්‍යමය ප්‍රතිපාදන සහ මානව සම්පත මනා කළමණාකරනයකින් යුක්තව ඉතා ඵලදායීව යොදා ගනිමින් රට නැවත ගොඩනැගීමේ කාර්යය සඳහා කැපවිය යුතුව ඇත.

03. එම අභියෝගවලට මුහුණ දෙමින් ඉදිරියට ගමන් කරන මෙම කාල පරිච්ඡේදය තුළ මහජන සේවා සැපයීමේ කාර්යක්ෂමතාව තහවුරු කරනු ලබන සුපිළිපන්න රජයේ සේවයක් උදෙසා රාජ්‍ය නිලධරයන් වශයෙන් අප සැමවිටම ඇපකැප වී කටයුතු කිරීම ප්‍රමුඛ කාර්යයක් සේ සැළකිය යුතු අතර ඒ සඳහා අවැසි අභිප්‍රේරණය සහ කැපවීම 2026 වසර ආරම්භයේදීම සියලු රාජ්‍ය නිලධරයන් තුළ රෝපණය කිරීම අතිශය වැදගත් කරුණක් වන බව අවධාරණය කරමි.

04. 2026 වසරේ රාජකාරි ඇරඹෙන පළමු දිනය වන ජනවාරි මස 01 වන බ්‍රහස්පතින්දා දින සියලු ම රාජ්‍ය නිලධරයන්ගේ සහභාගීත්වයෙන් සිය සේවා ස්ථානවල රාජකාරි කටයුතු ආරම්භ කිරීමේ නිල උත්සව පැවැත්විය යුතු ය. මහජනතාවට කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවාවක් ලබා දීම සඳහා සමස්ත රාජ්‍ය සේවය ම ඒ සඳහා තිර අදිටනින් කැපවිය යුතු බැවින් එදින පහත දැක්වෙන වැඩසටහන් ජාතික, පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මට්ටම් නියෝජනය කරන සියලු ම රාජ්‍ය ආයතන හා කාර්යාලවල පැවැත්වීමට ක්‍රියා කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන වැඩපිළිවෙල යොදා ගත යුතු වේ.

I. ජාතික ධජය එසවීම හා ජාතික ගීය ගායනා කිරීම.

II. ත්‍රිවිධ හමුදා සාමාජිකයින් ඇතුළු දේශය වෙනුවෙන් දිවි කැප කළ සියලු ම දෙනා සැමරීම සඳහා විනාඩි දෙකක (02) නිශ්ශබ්දතාවක් ආරක්ෂා කිරීම.

III. සියලු ම කාර්යය මණ්ඩල සමාජිකයන් තම තමන්ට පහසු භාෂාවකින් තම සේවා ස්ථානවල සිට මේ සමඟ එවා ඇති රාජ්‍ය සේවා ප්‍රතිඥාව/ දිවුරුම හඬ නගා කියවීම.

IV. වත්මන් අභියෝග ජය ගැනීම සඳහා හඳුන්වා දී ඇති රාජ්‍ය ප්‍රතිපත්ති හා වැඩපිළිවෙල පිළිබඳව හා එකී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය නිලධරයාගේ දායකත්වය පිළිබඳව ඔවුන් අභිප්‍රේරණය කරමින් කෙටි දේශනයක් පැවැත්වීම.

05. මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන
අමාත්‍යාංශය

දුරකථන : 0112662340
ෆැක්ස් : 0112692158
විද්‍යුත් ලිපිනය : ade-i@pubad.gov.lk

පිටපත් -:
1. ගරු පළාත් ආණ්ඩුකාරවරුන් - කාරුණික දැනගැනීම සඳහා
2. ජනාධිපති ලේකම් - අවශ්‍ය කටයුතු සඳහා
3. අග්‍රාමාත්‍ය ලේකම් - අවශ්‍ය කටයුතු සඳහා
4. අමාත්‍ය මණ්ඩලයේ ලේකම් - අවශ්‍ය කටයුතු සඳහා
5. විගණකාධිපති - අවශ්‍ය කටයුතු සඳහා

## <u>රාජ්‍ය සේවයේ ප්‍රතිඥාව / දිවුරුම</u>

දෙදහස් විසිහය වසරේ රාජකාරි අරඹන පළමුවැනි දිනය වන අද දින,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය, දේශයේ මුළු මහත් ජනතාවගේ

අධිෂ්ඨාන පෙරදැරි කරගත් අපේක්ෂා යථාර්ථයක් බවට පත් කරන

සෞභාග්‍යමත් නව වසරක සමාරම්භය, මෙසේ සනිටුහන් කරන වගයි.

අදින් ඇරඹෙන අභිනව වසර

එක් ධජයක සෙවණ ලද රටක්, දැයක් ලෙස

අකම්පිතව නැඟී සිටින්නට

දිරිය ලද ජනතාවකගේ අභිමානය

කියාපාන්නට මෙන්ම

"පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" තුළින්

අභියෝග හමුවේ නොසැලෙමු තේමාවේ

හරය එතුළින් විදහාපාන්නටත්

මඟ පෙන්වන සුසංවිධිත රාජ්‍ය පාලනයක

කොටස්කරුවකු වශයෙන්

මම,

මහජන මුදලින් වැටුප් ලබන රජයේ නිලධරයෙකු ලෙස

රාජ්‍ය ප්‍රතිපත්ති හා අරමුණු ක්‍රියාත්මක කිරීමෙහි ලා

මා වෙත පැවරෙන්නා වූ කාර්යභාරය

කාර්යක්ෂමව,

සඵලදායීව,

තිර අදිටනින් යුතුව,

උපරිම කැපවීමෙන්,

අවංකභාවයෙන්,

මහජනතාවට පක්ෂපාතීව,

සපුරා ඉටු කරන බවට ප්‍රතිඥා දෙමි/ දිවුරුම් දෙමි.